# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,078 - 2018 ජූනි මස 29 වැනි සිකුරාදා - 2018.06.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1422 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1425 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1428 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | 1431 |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1437 |


**සැ. යු.-** (i) අමරදේව සෞන්දර්ය හා පර්යේෂණ කේන්ද්‍රය පනත් කෙටුම්පත 2018 ජූනි මස 14 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

(ii) සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත 2018 ජූනි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2018 ජූලි මස 20 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 ජූලි මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය - මහියංගනය

### මහියංගන මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් කිසිවෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

01. මහියංගනය මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් කිසිවෙකු හිමිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩ 2018 ජූලි 21 වැනි දින පෙ. ව. 10.00 ට මහියංගනය මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම්පාන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු අතර, ඒ පිළිබඳව සලකා බැලීම සඳහා අදළ භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරනු ලැබේ.

03. අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගෙන් අවසර ලබාගෙන වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පමණ පෙර වෙන්දේසියට නියමිත භාණ්ඩ මහජනතාවට පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ භාර ගැනීමේ දී හා මුදල් ගෙවීමේ දී ජාතික හැඳුනුම්පත රැගෙන ඒම අනිවාර්ය වේ.

06. සියලුම ගෙවීම් මුදලින් ගෙවිය යුතු අතර මිලදී ගන්නා භාණ්ඩ වෙන්දේසිය පවත්වන දිනයේ ප. ව. 4.30 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

කේ. ආර්. නාලක වීරසිංහ,
දිසා විනිසුරු සහ මහෙස්ත්‍රාත්,
මහියංගනය.

2018 ජුනි මස 05 වැනි දින,
මහියංගන දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

#### වෙන්දේසි භාණ්ඩ ලැයිස්තුව

| අනු. අංකය | නඩු අංකය | | භාණ්ඩ විස්තරය |
|---|---|---|---|
| 01. | AR 1756 | JL 6631 | යතුරු පැදිය |
| 02. | AR 1764/16 | HN 3528 | යතුරු පැදිය |
| 03. | 98910/15 | NCSE 8265 | අත්ට්‍රැක්ටරය සහ ටේලරය |
| 04. | AR 1762 | අංක රහිත | යතුරු පැදිය |
| 05. | 91730 | UPVR 7590 | යතුරු පැදිය |
| 06. | 8589 | අංක රහිත | අත් ට්‍රැක්ටරය |
| 07. | 1153 | අංක රහිත | යතුරු පැදිය |
| 08. | 7563 | අංක රහිත | අත් ට්‍රැක්ටරය |
| 09. | 3125 | අංක රහිත | අත් ට්‍රැක්ටරය සහ ටේලරය |
| 10. | 8493 | අංක රහිත | අත් ට්‍රැක්ටරය |
| 11. | 4179/16 | අංක රහිත | අත් ට්‍රැක්ටරය සහ ටේලරය |
| 12. | 91508 | TF 70 | අත් ට්‍රැක්ටරය සහ ටේලරය |
| 13. | 83206 | අංක 114/5387 | යතුරු පැදිය |
| 14. | 85837 | EPHA 4140 | යතුරු පැදිය |
| 15. | 4232 | අංක රහිත | අත් ට්‍රැක්ටරය |
| 16. | 9103 | අංක රහිත | අත් ට්‍රැක්ටරය |
| 17. | 4178 | අංක රහිත | අත් ට්‍රැක්ටරය |
| 18. | 5287 | SD 2501 | අත් ට්‍රැක්ටරය සහ ටේලරය |
| 19. | 16771 | | ගෑස් සිලින්ඩරය හා ගෑල් ලිප |
| 20. | 16821 | | ගෑස් ලිප |
| 21. | 16125 | | කිරි එකතු කිරීමේ ඇලුමිනියම් භාජනයක් |
| 22. | අංක රහිත | | බූලි තොගයක් |
| 23. | අංක රහිත | | තඹ බට තොගයක් |
| 24. | අංක රහිත | | රබර් බට තොගයක් |
| 25. | අංක රහිත | | ඇලුමිනියම් මුට්ටි 05ක් |
| 26. | අංක රහිත | | සවල් තොගයක් |
| 27. | අංක රහිත | | යකඩ බාල්දි තොගයක් |
| 28. | 18287 | | ප්ලාස්ටික් බැරල් 03ක් |
| 29. | 18279 | | ප්ලාස්ටික් කල ගෙඩි 01ක් |
| 30. | අංක රහිත | | යකඩ බැරල් 12ක් |
| 31. | අංක රහිත | | පාපැදි අබලි කොටස් තොගයක් |
| 32. | අංක රහිත | | පැදුරු 05ක් |
| 33. | 18797 | | හෙල්මට් 11ක් |
| 34. | අංක රහිත | | අලවංගු 15ක් |
| 35. | අංක රහිත | | උදලු 15ක් |
| 36. | අංක රහිත | | පොරෝ 10ක් |
| 37. | AR 1673/17 | | එන්ජිම රහිත ෆයිබර් බෝට්ටු 01 |
| 38. | AR 1674/17 | | එන්ජිම රහිත ෆයිබර් බෝට්ටු 01 |
| 39. | AR 1675/17 | | එන්ජිම රහිත ෆයිබර් බෝට්ටු 01 |
| 40. | AR 1677/17 | | එන්ජිම රහිත ෆයිබර් බෝට්ටු 01 |
| 41. | AR 1678/17 | | කැඩී ගිය බෝට්ටුවක කැබලි |
| 42. | AR 1680/17 | | එන්ජිම රහිත ෆයිබර් බෝට්ටු 01 |
| 43. | AR 1681/17 | | එන්ජිම රහිත ෆයිබර් බෝට්ටු 01 |
| 44. | AR 1684/17 | | එන්ජිම රහිත ෆයිබර් බෝට්ටු 01 |
| 45. | AR 1607/17 | | එන්ජිම රහිත ෆයිබර් බෝට්ටු 01 |
| 46. | AR 1580/17 | | එන්ජිම රහිත ෆයිබර් බෝට්ටු 01 |
| 47. | 17534 | | විල් බැරෝ 01 |
| 48. | 17535 | | විල් බැරෝ 01 |
| 49. | 17528 | | විල් බැරෝ 01 |
| 50. | 17525 | | විල් බැරෝ 01 |
| 51. | 17104 | | විල් බැරෝ 01 |
| 52. | 17106 | | විල් බැරෝ 01 |

06-957

## සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය - රක්වාන

### අධිකරණය මගින් රාජසන්තක කරනු ලැබූ ද්‍රව්‍ය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

රක්වාන මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද, පහත සඳහන් භාණ්ඩ 2018.07.18 දින ප.ව. 1.00 ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් කිසියම් ද්‍රව්‍යයක් පිළිබඳ හිමිකම් පාන්නෙක් වේ නම්, වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතුය.

03. වෙන්දේසිය පැවැත්වීමට පැය භාගයකට පෙර, රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත අදාළ භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරන අවම ලන්සුව නොපිළිගන්නා අවස්ථාවක, අදාළ භාණ්ඩය වෙන්දේසියෙන් ඉවත් කිරීමට අධිකරණයට බලය ඇත.

05. මිලදී ගන්නා භාණ්ඩ ඒ අවස්ථාවේදීම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

06. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් ආදිය භාර නොගැනේ.

07. ගැණුම්කරුවන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

එච්. ජී. ජේ. ආර්. පෙරේරා,
දිසා විනිසුරු සහ මහෙස්ත්‍රාත්,
පැල්මඩුල්ල.

2018 මැයි මස 31 වැනි දින,
පැල්මඩුල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### වෙන්දේසි කිරීමට නියමිත නඩු භාණ්ඩ

| අනු. අංකය | නඩු අංකය | නඩු භාණ්ඩ |
|---|---|---|
| 01 | 70788 | යකඩ උදලු 01 යි, යකඩ මුල්ලු 01 යි, යකඩ අලවංගු 01 යි |
| 02 | 71729 | යකඩ 01 යි |
| 03 | 71739 | කුඩ 01 යි |
| 04 | 73570 | උදලු 01 යි, කුඩා චේවැල් කුඩ 01 යි |
| 05 | 73571 | ඉල්ලන් කුරු 01 යි, වර්ගය අපැහැදිලි අඟල් 02 වතුර මෝටර් 01 යි, හෝස් බට 01 යි |
| 06 | 75643 | 50kg ඩිජිටල් තරාදියක් |
| 07 | 75638 | 50kg ඩිජිටල් තරාදියක් |
| 08 | 75639 | 50kg දුනු තරාදියක් |
| 09 | 75641 | 50kg ඩිජිටල් තරාදියක් |
| 10 | 70425 | ඇලුමිනියම් මුට්ටි 01 යි |
| 11 | 72126 | ඇලුමිනියම් මුට්ටි 01 යි |
| 12 | 73125 | ඇලුමිනියම් මුට්ටි 01 යි |
| 13 | 71728 | ගැරුම් වට්ටි 01 යි |
| 14 | 73201 | යකඩ අලවංගු 01 යි |
| 15 | 72636 | ගැරුම් වට්ටි 01 යි, උදලු 01 යි |
| 16 | 75748 | උදලු 02 යි, ගැරුම් වට්ටි 02 යි, චේවැල් කුඩ 02 යි, ලන්තෑරුම් 01 යි, පන්දම් 01 යි, කැට කුඩ 01 යි, යකඩ ඉනි 02 යි |
| 17 | AR.1351/17 | සවල් 02 යි |
| 18 | AR.1270/17 | ඇඳුම් උදලු 02 යි |
| 19 | 75144 | ඇළුමිනියම් මුට්ටි 01 යි |
| 20 | 72127 | ඇලුමිනියම් මුට්ටි 01 යි, සිදුරු ඇති ඇළුමිනියම් මුට්ටි 01 යි |
| 21 | 70110 | ඇලුමිනියම් හිල් මුට්ටි 01 යි |
| 22 | 76614 | මිලි මීටර් 16 ප්‍රමාණයේ අඩි 19 ක් දිග කම්බි කුරු 74 යි |
| 23 | 76629 | ඇලුමිනියම් මුට්ටි 01 යි |
| 24 | 72128 | ලිට්රෝ 12.5Kg ගෑස් සිලින්ඩර් 01 යි, රෙගියුලේටර් සවි කරන ලද ගෑස් ලිප් 01 යි |
| 25 | 76091 | රෙගියුලේටර් සවි කළ ගෑස් ලිප් 01 යි, 12.5kg ලිට්රෝ ගෑස් සිලින්ඩර් 01 යි |
| 26 | 71711 | ලියාපදිංචි අංක රහිත ෆැට් මාස්ටර් වර්ගයේ අත් ට්‍රැක්ටරය, එන්ජින් පනගන්වන හැඬලය, රබර් බෙල්ට් එක - කැබලි කර විකිණීමට |

| අනු. අංකය | නඩු අංකය | නඩු භාණ්ඩ |
|---|---|---|
| 27 | 75072 | ලියාපදිංචි අංක රහිත ඉසිනි වර්ගයේ අත් ට්‍රැක්ටරය, පනගන්වන හැඬලය හා රබර් බෙල්ට් 01 - කැබලි කර විකිණීමට |
| 28 | 73315 | Jintian වර්ගයේ අංක රහිත අත් ට්‍රැක්ටරය හා පන ගන්වන හැඬලය - කැබලි කර විකිණීමට |
| 29 | 74882 | ලියාපදිංච අංක රහිත Sefin වර්ගයේ අත් ට්‍රැක්ටරය, රබර් බෙල්ට් 02 හා පනගන්වන හැඬලය - කැබලි කර විකිණීමට |
| 30 | 74579 | ලියාපදිංචි අංක රහිත Sefan වර්ගයේ අත් ට්‍රැක්ටරය, රබර් බෙල්ට් 01 හා පනගන්වන හැඬලය - කැබලි කර විකිණීමට |
| 31 | 74471 | අංක රහිත Sefan වර්ගයේ අත් ට්‍රැක්ටරය, රබර් බෙල්ට් එක හා ට්‍රැක්ටරය පනගන්වන හැඬලය - කැබලි කර විකිණීමට |
| 32 | - | ලොකු තැටි පිඟන් 02 යි |
| 33 | - | කුඩා නයිට් 09 යි |
| 34 | - | පොඩි තැටි පිඟන් 03 යි |
| 35 | - | දීසි 04 යි |
| 36 | - | ලී ඇඳන් 01 යි |
| 37 | - | බෝල කුඩු 02 යි |
| 38 | - | වැල් හාන්සි පුටු 01 යි |
| 39 | - | රෙදි ස්ක්‍රීන් 01 යි |
| 40 | - | බූලි තොගයක් |
| 41 | - | බැරල් තොගයක් |
| 42 | - | බෝතල් තොගයක් |

| අනු. අංකය | නඩු අංකය | නඩු භාණ්ඩ |
|---|---|---|
| 01 | 75193 | උදළු 01, ගැරුම් වට්ටි 04 යි |
| 02 | 75189 | ඇදුම් උදළු 05, යකඩ පතු 02 යි |
| 03 | 72287 | උදළු 01 යි, බාල්දි 01 යි, කැට කුඩ 01 යි, ගැරුම් වට්ටි 02 යි |
| 04 | 72075 | ගෑස් සිලින්ඩර් 02 යි |
| 05 | 74020 | පොරව 01 යි |
| 06 | 75017 | ගෑස් සිලින්ඩර් 05 යි |
| 07 | 67317 | ගෑස් සිලන්ඩර් 01 යි, ලිප් 01 යි |
| 08 | 70140 | අලුමිනියම් මුට්ටි 01 යි |
| 09 | 64962 | යකඩ බාල්දි 01 යි |
| 10 | 75574 | ගැරුම් වට්ටි 02 යි, කුඩා කුඩ 01 යි, උදළු 01 යි |
| 11 | 75192 | ගැරුම් වට්ටි 01 යි, බාල්දි 01 යි |
| 12 | 74786 | ගැරුම් වට්ටි 01 යි |
| 13 | 74533 | වේවැල් කුඩ 02 යි |
| 14 | 41833 | තඹ පටි රෝල් 02 යි |
| 15 | 74018 | ගෑස් සිලින්ඩර් 01 යි, ලිප් 01 යි |
| 16 | 72166 | අලුමිනියම් මුට්ටි 01 යි |
| 17 | 76225 | උදලු 01 යි, ගැරුම් වට්ටි 01 යි |
| 18 | 76985 | ගැරුම් වට්ටි 01 යි, වේවැල් කුඩ 01 යි, යකඩ පනිට්ටු 01 යි |
| 19 | 76986 | ඇඳුන් අඳලු 01 යි |
| 20 | 60389 | අංක SGWQ 6576 දරන යතුරු පැදිය - කැබලි කර විකිණීම සඳහා |
| 21 | ඒආර්97/13 | අත් ට්‍රැක්ටර් එන්ජිම හා ටේලරය - කැබලි කර විකිණීම සඳහා |
| 22 | 75685 | අත් ට්‍රැක්ටර් එන්ජින් 01 යි - කැබලි කර විකිණීම සඳහා |
| 23 | 72765 | අත් ට්‍රැක්ටර් එන්ජින් 01 යි - කැබලි කර විකිණීම සඳහා |
| 24 | අංක රහිත | අත් ට්‍රැක්ටර් එන්ජින් 03 යි - කැබලි කර විකිණීම සඳහා |
| 25 | 74150 | ප්ලාස්ටික් වතුර ටැංකි 01 ක් |
| 26 | | බෝතල් තොගයක් |
| 27 | | බූලි තොගයක් |
| 28 | | බැරල් තොගයක් |

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

2019 වර්ෂය සඳහා රා තැබෑරුම් විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකර ඇති 1983 වර්ෂයට හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී පවත්නා සෑම සුරාබදු කොන්දේසියකටමත් යටත්ව, 2019 වර්ෂය තුළ දී පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන රා තැබෑරුම්වල සිල්ලරට රා විකිණීමේ තනි අයිතිය මිල දී ගැනීම සඳහා කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් 2018.08.14 වැනි දින පෙ. ව. 10.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. *(අ)* සෑම ටෙන්ඩරයක් ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් පෝරමයක් විය යුතු ය.

*(ආ)* ටෙන්ඩර් මුදලක් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත උපලේඛනයේ දැක්වෙන ආකාර ටෙන්ඩර් මුදලක් තැන්පත් කර නිල කුවිතාන්සියක් සහ

*(ඇ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගන්නා ලද වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතු ය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම පිළිබඳ යථෝක්ථ රා තැබෑරුම් විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර්කරුවන් වෙත නිවේදනය කෙරේ.

*(ඈ)* ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි ද සැලකිලිමත් විය යුතු ය ඃ

*(a)* ටෙන්ඩර්පත්‍ර මුලුමනින් ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කෙරෙන ගණන ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය.

*(b)* සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත්‍රවල නියමිත සාක්ෂිකරුවන්ගේ සාක්ෂිවලට අමතරව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පත් අංක ද යෙදිය යුතු ය.

*(c)* සෑම වෙනස් කිරීමක්/කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන සහ දිනය යෙදීමෙන් සහතික කළ යුතු ය.

*(d)* සෑම ටෙන්ඩර්කරුවෙකුම ටෙන්ඩර් පෝර්මය සමග තම ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතු ය. මෙම නියමයන්ට පටහැනි ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබා ගන්නා නිල කුවිතාන්සියක් සහ වත්කම් පිළිබඳ සහතිකයත් සමග ලියුම් කවරයක බහා මුද්‍රා තබා කවරයේ වම් පස ඉහළ කෙළවරේ ''නියමිත තැබෑරුම් අංකය සහ නම'' සඳහන් කර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාරගැනීම අවසන් වීමට පෙර තැන්පත් කළ යුතු ය. ටෙන්ඩර් පත්‍රය තැපෑලෙන් එවන්නේ නම්, ටෙන්ඩර් භාරගැනීමේ වේලාව ඉකුත්වීමට පෙර ''ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කොත්මලේ''යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. ටෙන්ඩර් භාරගැනීමේ අවසන් වේලාව පහත උපලේඛනයේ දැක්වේ. එකී වේලාවට ටෙන්ඩර්කරුවන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. ඕනෑම ටෙන්ඩරයක් භාරගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මා සතුය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු, ගැණුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම, එදින ප. ව. 2.00 ට පෙර, ඇප තැන්පත් මුදල වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලැබිය හැකි වාරික තුනකට නොඅඩු මුදලක් ඇප තැන්පත් වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කළ යුතු ය. එම මුදල මා නමින් පුණ්ඩළුඔය මහජන බැංකුවේ වර්ෂයක ස්ථාවර තැන්පත් ගිණුමක රඳවා තැබීමට රේන්දකරුවන් එකඟ විය යුතු ය. මෙම තැන්පතුව මුදලින් හෝ බැංකුවක් විසින් ගෙවීම සඳහා ද යන්න සඳහන් කරන ලද චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් ආරක්ෂිත චෙක්පත් ස්වරූපයෙන් ගෙවිය යුතු ය.

07. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට කොන්දේසි මාලාවට සහ කොන්ත්‍රාත්තුවට ටෙන්ඩර්කරු අත්සන් තැබිය යුතු ය.

08. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ය.

09. කිසියම් ටෙන්ඩරයක් කිහිප දෙනෙකු විසින් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම්, ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතු ය.

10. යම් රා තැබෑරුමක් මෙදින විකුණනු නොලැබුවහොත් 2018.09.26 වැනි දින පෙ. ව. 10.30 ට මෙම ස්ථානයේ දී ම විකුණනු ලැබේ.

11. මෙම ටෙන්ඩරය විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

12. රේන්ද විකිණීම හා අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා ලබා ගත හැකි ය.

ඊ. ආර්. එල්. බී. ඇටම්පාවල,
ප්‍රාදේශීය ලේකම්.
කොත්මලේ.

2018 ජුනි මස 07 වැනි දින,
කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අංකය හා තැබෑරුමේ නම* | *තැබෑරුම පිහිටි ස්ථානය* | *ටෙන්ඩර් භාරගැනීම අවසන් වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල (රු.)* |
|---|---|---|---|
| *රා තැබෑරුම් :* | | | |
| අංක 1 - කඩදොරපිටිය | කඩදොරපිටිය ග්‍රාමය තුළ | 2018.08.14 පෙ. ව. 10.30 | 5,000 |
| අංක 2 - ඕතලාව | තෝරාගනු ලබන ස්ථානයකට කොත්මලේ ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබාගත් ලිපියක් ඉදිරිපත් කළ යුතු ය | 2018.08.14 පෙ. ව. 10.30 | 5,000 |
| අංක 3- කටුකිතුල | කටුකිතුල ග්‍රාමය තුළ | 2018.08.14 පෙ. ව. 10.30 | 5,000 |

06-968/1

---

**මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ 2018/2019 වර්ෂයේ රා, මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම**

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ 1983 වර්ෂයේ හා ඊට පසු කාල පරිච්ඡේදය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී වලංගුව පවත්වාගෙන යන සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහි බලපාන පොදු සුරාබදු කොන්දේසිවලටත් යටත්ව 2018/2019 වර්ෂය තුළ රා සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයක් මිල දී ගැනීම සඳහා මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් වන මවිසින් 2018.08.21 වැනි දින පෙරවරු 10.30 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක් ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි ආකෘති පත්‍රයකින් සකස් විය යුතු අතර,

(අ) ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත සඳහන් කර ඇති අන්දමට ටෙන්ඩර් ඇප මුදලක් තැන්පත් කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක් ; සහ

*(ආ)* ටෙන්ඩර්කරුගේ ඉඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් තැනගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථෝක්ත රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතා ගැන විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

(i) ටෙන්ඩර් පත්‍රය මුළුමනින් ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය ;

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් ආකෘති පත්‍රයෙහි සාක්ෂිකරුවන්ගේ අත්සන් යොදා තිබිය යුතු ය ;

(iii) සෑම වෙනස් කිරීමක් හෝ වචන කපාහැරීමක් මත ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන සහ දිනය යොදා සහතික කර තිබිය යුතු ය ;

(iv) අසම්පූර්ණ අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ ටෙන්ඩර් පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කර ලබාගන්නා ලද -

*(අ)* ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ කුවිතාන්සිය ; සහ
*(ආ)* වත්කම් සහතිකයක්,

සමග ලියුම් කවරයක බහා මුද්‍රා තබන ලියුම් කවරයෙහි වම් කෙළවරේ මුදුනේ "තැබෑරුමේ නම සහ අංකය" සඳහන් කර මහනුවර කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි ටෙන්ඩර් භාර ගැනීම අවසන් වීමට ප්‍රථම තැන්පත් කළ යුතු ය. එසේ නැතහොත් ටෙන්ඩර් භාරගැනීමේ වේලාව ඉකුත් වීමට ප්‍රථම මහනුවර ප්‍රාදේශීය ලේකම්තැනට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. එක් රේන්දයක් වෙනුවෙන් භාර ගැනීම අවසන් කරන වේලාව උපලේඛනයෙහි සඳහන් කර ඇත. එම වේලාවන්හි දී සියලුම ටෙන්ඩර්කරුවන් මහනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. සාර්ථක ලෙස ටෙන්ඩර් ඉදිරිපත් කළ අය වරප්‍රසාද මිල දී ගත් තැනැත්තායි ප්‍රකාශ කරනු ලැබීමෙන් පසු එම දින පස්වරු 2.30 ට පෙර මහනුවර ප්‍රාදේශීය ලේකම් තැන විසින් නියම කරනු ලැබූ මුදලක් ඇප වශයෙන් මහනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.

මෙම ගෙවීම මුදලින් හෝ බැංකුවක් විසින් **"ගෙවීම සඳහා"** යැයි ලකුණු කළ චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් **"ආරක්ෂිත චෙක්පත් "** නමැති ස්වරූපයකින් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ බැංකුවකින් ඒ බැංකුවේ නමට නිකුත් කරන ලද චෙක්පතකින් ගෙවිය යුතු ය. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට මත්පැන් තැබෑරුම් කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතු ය.

06. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි ය.

07. කිසියම් ටෙන්ඩරයක් කිහිප දෙනෙකු වශයෙන් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඒ ඒ එක් එක් අයවළුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙත වෙන ම පැහැදිලිව දැක්විය යුතු ය.

08. රා තැබෑරුම්වල හෝ වෙනත් බලපත්‍රයක් ලත් ස්ථානවල හෝ විකිණීම සඳහා තොග (පීප්ප) රා නිකුත් නොකරනු ලබන බව සැලකිය යුතු ය.

09. මහනුවර ඇසළ පෙරහැර සමයේ දී හා වෙනත් හේතූන් මත මෙහි උපලේඛනයේ සඳහන් අංක 01 දරන රා තැබෑරුම තාවකාලිකව වසා තැබීමට නියෝගයක් නිකුත් කිරීමට මා හට සිදුවුවහොත් එම වසා තැබීමේ කාලය තුළ දී රේන්ද වාරික සහන සැලසීමක් කරනු නොලැබේ.

10. පූර්වෝක්ත දිනයේ දී විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2018.10.12 වැනි දින පෙ. ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

11. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

12. ටෙන්ද විකිණීම හා අදාළ කොන්දේසි හෝ වෙනත් වැඩි විස්තර මෙම කාර්යාලයෙන් විමසා දැනගත හැකි ය.

බී. එම්. පී. ජී. පී. වී. බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළය.

2018 ජුනි මස 08 වැනි දින,
මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

**2018/2019 වර්ෂය සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ අනුමත කරන ලද රා තැබෑරුම් ලැයිස්තුව**

| *අනුක්‍රමික අංක, කොට්ඨාසය, තැබෑරුම පිහිටුවිය යුතු කොට්ඨාසය, තැබෑරුම* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු කොට්ඨාසය* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන දිනය හා වේලාව* |
|---|---|---|---|---|
| 01. අංක 1 වටපුළුව | මහනුවර කොට්ඨාසයේ අංක 20 මහයියාව සහ අංක 7 මාපනාවතුර ඡන්ද කොට්ඨාසය | කටුගස්තොට පාරේ එම පාර සහ ත්‍රිකුණාමල වීදිය මංසන්ධියෙහි කටුගස්තොට පාර සහ වට්ටාරන්තැන්න මංසන්ධිය අතර පාර මහනුවර නාගරිකයේ අංක 20 මහයියාව සහ අංක 7 මාපනාවතුර ඡන්ද කොට්ඨාසය තුළ පිහිටි ප්‍රදේශය | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 දක්වා සහ ප. ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා | 2018.08.21 පෙ. ව. 10.30 |

*රා තැබෑරුම් සඳහා තැන්පත් කළ යුතු ටෙන්ඩර් තැන්පත් මුදල - 2018/2019*

අංක 1 වටපුළුව - රා තැබෑරුම් ටෙන්දය රුපියල් 5,000.

06-969/1

---

# රජයේ නොවන දැන්වීම්

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : අසංක ට්‍රේඩින් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 00200301
ලියාපදිංචි ලිපිනය : අංක 59, මහවීදිය, හංවැල්ල
සංස්ථාගත කළ දිනය : 2018 මැයි 15

සමාගමේ අධ්‍යක්ෂක.

06-960

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : එකෝරිච් හයිඩ්‍රොපොනික් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 129624
ලියාපදිංචි ලිපිනය : අංක 05/240, මීගමු පාර, පන්නල
සංස්ථාගත කළ දිනය : 2018 පෙබරවාරි 07

සමාගමේ අධ්‍යක්ෂක.

06-961

## රෝස් ෆීල්ඩ් ප්ලාන්ටේෂන්ස් (පීවීටී) එල්ටීඩී

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම.

2018 මැයි මස 28 වැනි දින සමාගම් ලියාපදිංචි අංක පී වී 131916 යටතේ ''රෝස් ෆීල්ඩ් ප්ලාන්ටේෂන්ස් (පීවීටී) එල්ටීඩී'' යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ එහි ලියාපදිංචි කාර්යාලය, අංක 15/බී, පෙරහැර මාවත, කොළඹ 03 යන ස්ථානයේ බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

එම් ඇන්ඩ් ඒ කම්පනි සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ ලේකම්වරු).

නිත්ති මුරුගේසු ඇන්ඩ් ඇසෝසියේට්ස් බාරේ,
නීතිඥවරු,
අංක 28, (2 වන මහල),
ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

06-974

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කෑගල්ල කච්චේරිය අඩි පාර, අංක 23/1 පදිංචි ක්‍රිෂාන්ත ශ්‍රී ශිරන්ත ඇතුගල (ජාතික හැඳුනුම්පත් අංක 853620874 V) යන ඇටෝර්නි අධිපති වන මා විසින් 2016.09.27 වැනි දින කෑගල්ලේ නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ජී. ආර්. අනෝමා ලක්මිණි කුමාරි මහත්මිය ලියා සහතික කළ අංක 188 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රයෙන් කෑගල්ල, දිළිදුගම, අංක 34 පදිංචිව සිටි සහ දැනට කෑගල්ල, පානකාව අංක 65/3 ඉන්දික බේක් හවුස් හි පදිංචි පෙඩ්දුරගේ ජයතිලක (ජා.හැ. අංක 531052544 V) යන අය මාගේ ඇටෝර්නි බලකරු ලෙසට පත් කරන ලද ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කොට අවලංගු කළ බැව් ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

තවද, ඉහත කී පෙඩ්දුරගේ ජයතිලක යන අය විසින් මින් ඉදිරියට මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් කරනු ලබන කිසිම ගණුදෙනුවකට හෝ ක්‍රියාවකට මා වග නොකියන බව ද තවදුරටත් දන්වා සිටිමි.

ක්‍රිෂාන්ත ශ්‍රී ශිරන්ත ඇතුගල,
ඇටෝර්නි අධිපති.

06-985

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව මෙයින් දන්වා සිටින වග නම්,

සමාගමේ නම : ටී - ප්ලැන් ලංකා (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00200098
ලියාපදිංචි කළ දිනය : 2018 මැයි මස 02 වැනිද
ලියාපදිංචි කාර්යාලය : අංක 97 ඒ, ගාලු පාර, කොළඹ 03.

අධ්‍යක්ෂක.

06-991

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ලෝන්ග්රිච් ඉන්ටර්නැෂනල් (පීවීටී) එල් ටී ඩී
සමාගමේ අංකය : පී වී 129138
ලියාපදිංචි කාර්යාලය : අංක 269/01/ඒ, අලුත් පාර, වේවැල්දූව, කැළණිය
ලියාපදිංචි දිනය : 2018.03.09

06-992

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

විජේකෝන් මුදියන්සේලාගේ වසන්තා විජේකෝන් (ජා. හැ. ප. අංක 676142649 V) යන ඇටෝර්නි අධිපති විසින් වත්තේගම, ඇල්කඩුව පාර, පුංචි මෝල, අංක 50 දරන ස්ථානයෙහි පදිංචි උඩගෙදර අජිත් ප්‍රියන්ත (ජා. හැ. ප. අංක 783301903 V) යන අය ඇටෝර්නිලාභියා ලෙස නම් කරමින්, ප්‍රසිද්ධ නොතාරිස් නවරත්න බණ්ඩාර මඩුගල්ල විසින් ලියා සහතික කළ අංක 269 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය අද දින සිට අවලංගු කරන බව මෙයින් දැනුම් දෙමි. එතැන් පටන් සිදුවන කිසිදු කරුණක් සම්බන්ධයෙන් මාගේ වගකීමක් හෝ බැඳීමක් නොමැති බව ද මෙයින් වැඩිදුරටත් දන්වා සිටිමි.

06-994

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : එටර්නිටි ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 129139
ලියාපදිංචි කළ දිනය : 2018.01.18
ලිපිනය : අංක 189/1, එම්/4, මහවිද්‍යාල මාවත, කොළඹ 13

සමාගම් ලේකම්වරු.

06-1007

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ස්ටෙපින් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 130579
ලියාපදිංචි කාර්යාලීය ලිපිනයඃඅංක 320/7, ගාලු පාර, කොළඹ 03
ලියාපදිංචි දිනය : 2018.03.09

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු)

06-1009

---

## මහජනතාව වෙත දැනුම් දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (01) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත සමාගම 2018 මැයි මස 31 වැනිදා ස්ථාපිත කළ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : එල්. ඩී. පාර්ක් සොලුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 00200696
ලියාපදිංචි කාර්යාලය : අංක 08, පන්සල පාර, මහරගම.

ආයතන සහකාර.

06-1107

---

## ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කිරීම

පිළියන්දල, කැස්බෑව, හොරණ පාර, මාවිත්තර උතුර, මීගහ පෙදෙස, අංක 16 සී දරන ස්ථානයේ පදිංචි ආනන්ද වික්‍රමසිංහ (ජා. හැ. ප. අංක 680842710 V) වන මම මඩපාත, මාකන්දන, අරලිය උයන, අංක 65/13 දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 770440335 V දරන නොයෙල් ප්‍රියන්ත වික්‍රමසිංහට බලය පවරමින් 2016.08.12 වැනි දින ධර්ම ශ්‍රී ශ්‍රියාසිංහ කොළඹ දිස්ත්‍රික් ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් සහතික කළ අංක 8493 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කර අහෝසි කරන බවත් මින් මතු එකී ඇටෝර්නි බලපත්‍රය කිසිදු නීත්‍යානුකූල වගකීමක් නොදරන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් සාමාන්‍ය ජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

ආනන්ද වික්‍රමසිංහ,
(ස්වකීය ඇටෝර්නි බලකාර තේවහෙට්ටිගේ ලක්ෂාන් නන්දුක සිල්වා මගින්)

2018 මැයි මස 08 වැනි දින.

06-1109

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

උතුරු කළුතර, උතුරු ශ්‍රී සුමංගල පාර, අංක 50 ''සිරිනිවස'' යන ලිපිනයේ පදිංචි ක්‍රිෂාන්ත ජානක විජේසේකර (ජා. හැ. අංකය 196516501034) වන මම කළුතර දිස්ත්‍රික්කයේ වස්කඩුව, මහවස්කඩුව අංක 114 හි පදිංචි ජාමුණි සුමිත් ජයන්ත ද සිල්වා යන අය වෙත ලබාදී ඇති පහත සඳහන් ඇටෝර්නි බලපත්‍ර 2018.06.01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් අවලංගු කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, ශ්‍රී ලංකාවාසී සියලු දෙනාටත් මෙයින් දැනුම් දෙමි.

එකී ඇටෝර්නි බලපත්‍ර නම්,

01. කළුතර ප්‍රසිද්ධ නොතාරිස් රංජිතා පී. නවරත්න මහත්මිය විසින් 2016 ක් වූ ජුනි මස 07 වැනි දින ලියා සහතික කරන ලද අංක 1316 දරන ඇටෝර්නි බලපත්‍රය.

02. කළුතර ප්‍රසිද්ධ නොතාරිස් පී. ඩී. හෙට්ටිආරච්චි මහතා විසින් 2011 ක් වූ ජනවාරි මස 28 වැනි දින ලියා සහතික කරන ලද අංක 5850 දරන ඇටෝර්නි බලපත්‍රය.

03. කළුතර ප්‍රසිද්ධ නොතාරිස් පී. අයි. එම්. දමුණගේ මහත්මිය විසින් 2013ක් වූ නොවැම්බර් මස 18 වැනි දින ලියා සහතික කරන ලද අංක 94 දරන ඇටෝර්නි බලපත්‍රය.

04. මා විසින් 2015ක් වූ අප්‍රේල් මස 08 වැනි දින විදේශයක දී අත්සන් තබන ලද නුගේගොඩ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ 160 කාණ්ඩයේ 36 පත්‍රිරුවේ දිනපොත් අංක 2407 යටතේ නිසි පරිදි ලියාපදිංචි කර ඇති විශේෂ ඇටෝර්නි බලපත්‍රය.

ක්‍රිෂාන්ත ජානක විජේසේකර.

06-1051

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

කැනඩාව, ඔන්ටාරියෝ, M1P 4W1 ස්කාර්බොරෝ, ඩන්ඩොක් ඩ්‍රෙව් #48, අංක 30 දරන ලිපිනයේ පදිංචි විඥනලිංගම් කාර්තිගේසු වන මම කැනඩාව, කියුබෙක් H1N 3R5, මොන්රියල්, 5777 ශේර්බ්‍රූක් Est # 203 යන ලිපිනයේ පදිංචි නීතිඥ මයිරියම් හාර්බෙක් විසින් සහතික කළ 2003.08.18 දිනැති ඇටර්නි බලපත්‍රය මගින් මොරටුව, සොයිසා ෆ්ලැට්ස්, අංක C 27 - 1/1 දරන ලිපිනයේ පදිංචි සෞපාක්කියවති ගනේෂන් වෙත පවරන ලද බලය අද දින සිට එනම් 2018.06.14 සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් දන්වා සිටිමි. තවද, සෞපාක්කියවති ගනේෂන් විසින් සිදු කරන ලද යම් හෝ සියලුම ගණුදෙනු වෙනුවෙන් මාගේ කිසිම සම්බන්ධතාවයක් නැති බව සඳහන් කරමි.

විඥනලිංගම් කාර්තිගේසු.

06-1111

---

**ලංකා ඔරික්ස් ප්‍රොජෙක්ට් ඩිවලොප්මන්ට් ලිමිටඩ් PB 153**

(ස්වේච්ඡාවෙන් වසා දැමීම)

ණය හිමියන්ගේ රැස්වීම පිළිබඳ දැනුම් දීමයි

**2007 අංක 7 දරන සමාගම් පනතේ 334 (2) වගන්තිය ප්‍රකාරව**

ඉහත නම් සඳහන් සමාගමේ ණය හිමියන්ගේ රැස්වීම 2018 ජුලි මස 06 වැනි දින පෙ. ව. 10.00 ට රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවත, අංක 100/1 එල්. ඕ. එල්. සී ප්‍රධාන කාර්යාලයෙහි දී පහත සඳහන් අරමුණු උදෙසා පැවැත්වේ.

අධ්‍යක්ෂවරුන් විසින් සකස් කරන ලද සමාගමේ කටයුතු පිළිබඳ තත්ත්වය ණය හිමියන් වෙත ප්‍රකාශ කර සිටීම.

සමාගමේ ණය හිමියන් විසින් ස්වේච්ඡාවෙන් ගනු දෙනු බේරා වසා දැමීම අනුමත කිරීම/සළකා බැලීම.

2007 අංක 7 දරන සමාගම් පනතේ 335 වන වගන්තියට අනුකූලව ඈවරකරුවෙකු පත් කිරීම.

ලංකා ඔරික්ස් ප්‍රොජෙක්ට් ඩිවලොප්මන්ට් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ක්‍රිශාන්ති එම්මානුවෙල් මෙනවිය,
සමාගම් ලේකම්.

2018 ජුනි මස 14 වැනි දින දී ය.

06-1112

---

# රටබීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

**කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

2019 වර්ෂය සඳහා විදේශ මත්පැන් තැබෑරුම් විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකර ඇති 1983 වර්ෂයට හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු විදේශීය මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන බීම වර්ග ඇතුළුව) තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී බලපවත්නා සෑම සුරාබදු කොන්දේසියකටමත් යටත්ව, 2019 වර්ෂය තුළ දී පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන විදේශ මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන බීම වර්ග ඇතුලුව) සිල්ලරට විකිණීමේ තනි අයිතිය මිල දී ගැනීම සඳහා කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් 2018.08.15 වැනි දින පෙ. ව. 10.30 දක්වා ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

02. (අ) සෑම ටෙන්ඩරයක් ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් පෝරමයක් විය යුතු ය.

(ආ) ටෙන්ඩර් මුදලක් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත උපලේඛනයේ දැක්වෙන ආකාර ටෙන්ඩර් මුදලක් තැන්පත් කර නිල කුවිතාන්සියක් ; සහ

(ඇ) ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගන්නා ලද වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතු ය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම පිළිබඳව යථෝක්ත විදේශීය මත්පැන් තැබෑරුම් විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර්කරුවන් වෙත නිවේදනය කෙරේ.

(ඈ) ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි ද සැළකිලිමත් විය යුතු ය :

(a) ටෙන්ඩර්පත්‍ර මුලුමනින් ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කෙරෙන ගණන ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය.

(b) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත්‍රවල නියමිත සාක්ෂිකරුවන්ගේ සාක්ෂිවලට අමතරව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පත් අංක ද යෙදිය යුතු ය.

(c) සෑම වෙනස් කිරීමක්/කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන හා දිනය යෙදීමෙන් සහතික කළ යුතු ය.

(d) සෑම ටෙන්ඩර්කරුවෙකුම ටෙන්ඩර් පෝරමය සමඟ තම ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතු ය. මෙම නියමයන්ට පටහැනි ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබා ගන්නා ලද නිල කුවිතාන්සිය සහ වත්කම් පිළිබඳ සහතිකය සමග ලියුම් කවරයක බහා මුද්‍රා තබා කවරයේ වම් පස ඉහළ කෙළවරේ ''නියමිත තැබෑරුම් අංකය සහ නම'' සඳහන් කර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාරගැනීම අවසන් වීමට පෙර තැන්පත් කළ යුතු ය. ටෙන්ඩර් පත්‍රය තැපෑලෙන් එවන්නේ නම්, ටෙන්ඩර් භාරගැනීමේ වේලාව ඉකුත් වීමට පෙර ''ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කොත්මලේ''යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාව පහත උපලේඛනයේ දැක්වේ. එකී වේලාවට ටෙන්ඩර්කරුවන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. ඕනෑම ටෙන්ඩරයක් භාරගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මා සතුය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු, ගැණුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම, එදින ප. ව. 2.00 ට පෙර, ඇප තැන්පත් මුදල වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලැබිය හැකි වාරික තුනකට නොඅඩු මුදලක් ඇප තැන්පත් වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කළ යුතු ය. එම මුදල මා නමින් පුණ්ඩළුඔය මහජන බැංකුවේ වාර්ෂික ස්ථාවර තැන්පත් ගිණුමක රඳවා තැබීමට රේන්දකරුවන් එකඟ විය යුතු ය. මෙම තැන්පතුව මුදලින් හෝ බැංකුව විසින් ගෙවීම සඳහා ද යන්න සඳහන් කරන ලද චෙක් පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් ආරක්ෂිත චෙක්පත් ස්වරූපයෙන් ගෙවිය යුතු ය.

07. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට කොන්දේසි මාලාවට සහ කොන්ත්‍රාත්තුවකට ටෙන්ඩර්කරු අත්සන් තැබිය යුතු ය.

08. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ය.

09. කිසියම් ටෙන්ඩරයක් කිහිප දෙනෙකු විසින් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම්, ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතු ය.

10. යම් තැබෑරුමක් මෙදින විකුණනු නොලැබුවහොත් 2018.09.21 වැනි දින පෙ. ව. 10.30 ට මෙම ස්ථානයේ දී ම නැවත විකුණනු ලැබේ.

11. මෙම ටෙන්ඩරය විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

12. රේන්ද විකිණීම හා අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා ලබා ගත හැකි ය.

ඊ. ආර්. එල්. බී. ඇටම්පාවල,
ප්‍රාදේශීය ලේකම්.
කොත්මලේ.

2018 ජුනි මස 07 වැනි දින,
කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අංකය හා තැබෑරුමේ නම* | *තැබෑරුම පිහිටි ස්ථානය* | *ටෙන්ඩර් භාරගැනීම අවසන් වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල (රු.)* |
|---|---|---|---|
| *විදේශ මත්පැන් තැබෑරුම :* අංක 2 - පුණ්ඩළුඔය | පුණ්ඩළුඔය නගරය ඉහළ කඩ වීදිය | 2018.08.15 පෙ. ව. 10.30 | 5,000 |

06-968/2

---

**මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය**

විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම - 2018/2019 වර්ෂය

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කළ 1983 වර්ෂයේ හා ඊට පසු කාල පරිච්ඡේදය සඳහා විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත් එම කාලය තුළ දී වලංගුව පවත්වාගෙන යන සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහි බලපාන පොදු සුරාබදු කොන්දේසිවලටත් යටත්ව 2018/2019 වර්ෂය තුළ විදේශ මත්පැන් සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයක් මිලදී ගැනීම සඳහා මහනුවර, කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් වන ම විසින් 2018.08.23 වැනි දින පෙරවරු 10.30 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි ආකෘති පත්‍රයකින් සකස් විය යුතු අතර-

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත සඳහන් කර ඇති අන්දමට ටෙන්ඩර් ඇප මුදලක් තැන්පත්කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක් ; සහ

*(ආ)* ටෙන්ඩර්කරුගේ ඉඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් තැනගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථොක්ත විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතා ගැන විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

(i) ටෙන්ඩර් පත්‍රය මුළුමනින්ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරින් ද ලිවිය යුතු ය.
(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් ආකෘති පත්‍රයෙහි සාක්ෂිකරුවන්ගේ අත්සන් යොදා තිබිය යුතු ය.
(iii) සෑම වෙනස් කිරීමක් හෝ වචන කපා හැරීමක් මත ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන සහ දිනය යොදා සහතික කර තිබිය යුතු ය.
(iv) අසම්පූර්ණ අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ ටෙන්ඩර් පත්‍රය, ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කර ලබා ගන්නා ලද,

*(අ)* ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ කුවිතාන්සිය ; සහ
*(ආ)* වත්කම් සහතිකයක්,

සමග ලියුම් කවරයක බහා මුද්‍රාතබන ලියුම් කවරයෙහි වම් කෙළවරේ මුදුනේ "තැබෑරුමේ නම සහ අංකය" සඳහන් කර මහනුවර කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි ටෙන්ඩර් භාර ගැනීම අවසන් වීමට ප්‍රථම තැන්පත් කළ යුතුයි. එසේ නැතහොත් ටෙන්ඩර් භාරගැනීමේ වේලාව ඉකුත් වීමට ප්‍රථම මහනුවර ප්‍රාදේශීය ලේකම් තැනට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. එක් රේන්දයක් වෙනුවෙන් භාරගැනීම අවසන් කරන වේලාව උපලේඛනයෙහි සඳහන් කර ඇත. එම වේලාවන්හි දී සියලුම ටෙන්ඩර්කරුවන් මහනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. සාර්ථක ලෙස ටෙන්ඩර් ඉදිරිපත් කළ අය වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා'යි ප්‍රකාශ කරනු ලැබීමෙන් පසු එම දින පස්වරු 2.30 ට පෙර මහනුවර ප්‍රාදේශීය ලේකම් තැන විසින් නියම කරනු ලැබූ මුදලක් ඇප වශයෙන් මහනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කළ යුතු ය. මෙම ගෙවීම මුදලින් හෝ බැංකුවක් විසින් "ගෙවීම සඳහා" යැයි ලකුණු කළ චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් "ආරක්ෂිත චෙක්පත්" නමැති ස්වරූපයකින් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ බැංකුවකින් ඒ බැංකුවේ නමට නිකුත් කරන ලද චෙක්පතකින් ගෙවිය යුතු ය. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට මත්පැන් තැබෑරුම් කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතු ය.

06. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකිය.

07. කිසියම් ටෙන්ඩරයක් කිහිප දෙනෙකු වශයෙන් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඒ ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙන ම පැහැදිලිව දැක්විය යුතු ය.

08. විදේශ මත්පැන් තැබෑරුම්වල හෝ වෙනත් බලපත්‍රයක් ලත් ස්ථානවල හෝ විකිණීම සඳහා තොග විදේශ මත්පැන් නිකුත් නොකරනු ලබන බව සැලකිය යුතු ය.

09. මහනුවර ඇසළ පෙරහැර සමයේ දී හා වෙනත් හේතු මත මෙහි උපලේඛනයේ සඳහන් අංක 01 දරන විදේශ මත්පැන් තැබෑරුම තාවකාලිකව වසා තැබීමට නියෝගයක් නිකුත් කිරීමට මා හට සිදුවුවහොත් එම වසා තැබීමේ කාලය තුළ දී රේන්ද වාරික සහන සැලසීමක් කරනු නොලැබේ.

10. පූර්වෝක්ත දිනයේ දී විකිණීමට නොහැකිවූ විදේශ මත්පැන් තැබෑරුම්, නැවත විකිණීම 2018.09.28 වැනි දින පෙ.ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

11. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසන් තීරණය වේ.

12. රේන්ද විකිණීම හා අදාළ කොන්දේසි හෝ වෙනත් වැඩි විස්තර මෙම කාර්යාලයෙන් විමසා දැනගත හැක.

බී. එම්. පී. ජී. පී. වී. බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
මහනුවර, කඩවත් සතර සහ ගඟවට කෝරළය.

2018 ජූනි මස 08 වැනි දින,
මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

*2018/2019 වර්ෂය සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ අනුමත කරන ලද විදේශ මත්පැන් තැබෑරුම් ලැයිස්තුව*

| *අනුක්‍රමික අංක කොට්ඨාසය තැබෑරුම පිහිටුවිය යුතු කොට්ඨාසය තැබෑරුම* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු කොට්ඨාසය* | *තැබෑරුම් විවෘත කරන වේලාව* | *ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන දිනය හා වේලාව* |
|---|---|---|---|---|
| 1 අංක කොළඹ වීදිය | මහනුවර නාගරිකයේ අංක 17 යටිනුවර සහ අංක 18 කොටුගොඩැල්ල වීදිය | මහනුවර නාගරිකයේ අංක 17 යටිනුවර සහ අංක 18 කොටුගොඩැල්ල ඡන්ද කොට්ඨාසය තුළ කොළඹ වීදිය සහ කාසල්හිල් වීදිය මං සන්ධියෙන් කොළඹ වීදිය වඩුගොඩපිටිය පාරේ මංසන්ධියටත් අතර කොළඹ වීදිය දෙපාර්ශවයේ | පෙ.ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා සහ ප.ව. 5.00 සිට ප.ව. 8.00 දක්වා | 2018.08.23 පෙ.ව. 10.30 |

*විදේශ මත්පැන් තැබෑරුම් සඳහා තැන්පත් කළ යුතු ටෙන්ඩර් තැන්පත් මුදල* - 2018/2019

1. අංක 1 විදේශ මත්පැන් තැබෑරුම් - රුපියල් 5,000.

06-969/2

---

## 2019 වර්ෂය සඳහා කළුතර දිස්ත්‍රික්කයේ හොරණ ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසයේ විදේශීය මත්පැන් රේන්දය විකිණීම

2019 ජනවාරි මස 01 වැනි දින සිට 2019 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා විදේශ මත්පැන් සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලට හා සෑම සුරාබදු බලපත්‍රයකට අදාළ එවකට බලපවත්වන කොන්දේසි මාලාවට යටත්ව පහත උපලේඛනයේ සඳහන් විදේශ මත්පැන් තැබෑරුම පවත්වාගෙන යාම සඳහා සුදුසු ගැනුම්කරුවකු තෝරාගැනීම පිණිස ටෙන්ඩර් භාර ගැනීම හොරණ ප්‍රාදේශීය ලේකම් වන මා විසින් 2018.08.13 වැනි දින පෙ. ව. 10.30 දක්වා සිදු කරනු ලැබේ.

**1. අංක 01 හොරණ විදේශීය මත්පැන් තැබෑරුම -**

02. *(අ)* ටෙන්ඩර් තැන්පත් මුදල වෙනුවෙන් රු. 3,000 ක් ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයක තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් සමග සෑම ටෙන්ඩරයක් ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත් නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍ර මගින් දෙපිටපතකින් ඉදිරිපත් කළ යුතු ය.

*(ආ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩර් පත්‍රයට අමුණා තැබිය යුතුය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථෝක්ත විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන්

විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත නිවේදනය කෙරේ. ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

(i) ටෙන්ඩර්පත්‍ර මුළුමනින්ම සම්පූර්ණ කළ යුතු ය. සඳහන් කරන මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරින් ද ලිවීම කළ යුතු ය.

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පෝරමවල නියමිත පරිදි සාක්ෂිකරුවන්ගේ අත්සන යොදා ඔවුන්ගේ ලිපිනයන් ද සඳහන් කර තිබිය යුතු ය.

(iii) සෑම වෙනස් කිරීමක් හෝ කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කර තිබිය යුතු ය. මෙම නියමයන්ට පටහැනිව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. සෑම ටෙන්ඩරයක්ම ටෙන්ඩර්කරුගේ නමින් ඉදිරිපත් කළ යුතු අතර, නියෝජිතයකු විසින් හෝ ලාංකික නොවූ හෝ 1982.08.20 වැනි දින අංක 207 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද විදේශීය මත්පැන් රේන්ද විකිණීමේ කොන්දේසි යටතේ නුසුදුසු අයගෙන් ටෙන්ඩර්පත්‍ර භාර ගනු නොලැබේ.

04. විධිමත්ව සකස් කරන ලද ටෙන්ඩර් පත්‍ර කවරයක බහා සීල් තබා කවරයේ වම් කෙළවරේ '' අංක 01 හොරණ විදේශ මත්පැන් තැබෑරුම ටෙන්ඩරය 2019'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය. එසේ සකස් කළ ටෙන්ඩර් පත්‍ර සහිත කවර,

*(අ)* හොරණ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන්, හෝ

*(ආ)* ලියාපදිංචි තැපෑලෙන් එවන්නේ නම් 2018.08.13 වැනි දින පෙ. ව. 10.30 වේලාවට පෙර කාර්යාලයට ලැබෙන සේ "ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, හොරණ" යන ලිපිනයට එවිය යුතු ය. ඉහත සඳහන් වේලාවෙන් පසුව තැපෑලේ දී ප්‍රමාද වී කාර්යාලයට ලැබෙන ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ටෙන්ඩරය විකුණන දින නියමිත වේලාවට සියලුම ටෙන්ඩර්කරුවන් හොරණ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයට පැමිණ සිටිය යුතු ය. මෙහි 3 වැනි ඡේදයේ සඳහන් රේන්ද විකිණීමේ කොන්දේසිය යටතේ නුසුදුස්සකු නොවන බව ඔප්පු කිරීමට අවශ්‍ය වුවහොත් ඊට අවශ්‍ය ලියකියවිලි ද රැගෙන ආ යුතු ය.

05. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බැව් දැන්වූ වහාම රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් තබා හොරණ ප්‍රාදේශීය ලේකම් විසින් ඇප තැන්පත් මුදල වශයෙන් නියම කරනු ලබන මුදලක් ද ගෙවිය යුතු ය.

06. 2019 වර්ෂයට දැනට තැබෑරුම පිහිටා ඇති ස්ථානය ලබාදීමට සහතික වනු නොලැබේ. අලුත් ස්ථානයක තැබෑරුම විවෘත කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් හොරණ ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතු ය.

07. වැඩි විස්තර හොරණ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් දැනගත හැකි ය.

මෙම දැන්වීම අනුව 2018.08.13 වැනි දින දී මෙම රේන්දය විකිණීමට නොහැකි වුවහොත් පමණක් 2018.09.20 වැනි දින පෙ. ව. 10.30 දක්වා විකිණීම පිණිස ටෙන්ඩර් පත්‍ර භාරගනු ලබන බව ද එසේම නැවත විකිණීම ද 2018.09.20 වැනි දින පෙ.ව. 10.30ට සිදු කරන බව ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. ඒ කමල් පුෂ්පකුමාර,
ප්‍රාදේශීය ලේකම්,
හොරණ.

2018 ජුනි මස 12 වැනි දින,
හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

***හොරණ අංක 01 දරන විදේශ මත්පැන් රේන්දය විකිණීම -2019***

| *අනු. අංකය* | *කොට්ඨාසයේ නම* | *පළාත් පාලන බල ප්‍රදේශය* | *තැබෑරුම විවෘත කර තබන වේලාවන්* | *තැබෑරුම් රේන්දය විකිණීමට ටෙන්ඩරය භාරගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *2018.08.13 දින විකිණීමට නොහැකි වුවහොත් නැවත විකිණීමේ දිනය හා වේලාව* |
|---|---|---|---|---|---|---|
| 01. | හොරණ | හොරණ නගර සභා සීමාව | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 දක්වා ප. ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා | 2018.08.13 දින පෙ. ව. 10.30 | 3,000 | 2018.09.20 දින පෙ. ව. 10.30 ට |

06-1006

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - කටුගස්තොට ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**පල්ලකැලේ රජයේ කර්මාන්තපුරයෙහි පිහිටි බොබි හඳුන්කූරු නිෂ්පාදන කර්මාන්ත ශාලාව**

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර උඩගම්පහ කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා සීමාව තුළ සහ කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පල්ලේකැලේ අංක 698 ග්‍රාම නිලධාරී වසම කෙන්ගල්ල ගමේ පිහිටි පල්ලකැලේ එස්ටේට් දන් පල්ලකැලේ රජයේ කර්මාන්තපුරය පරිශ්‍රය තුළ පිහිටි දෙමහල් කර්මාන්ත ශාලාව අනෙකුත් ගොඩනැගිලි ඇතුළු සියලු දේ.

ඉඩමේ ප්‍රමාණය : පර්චස් 44

මෙම දේපළ මහනුවර මාවිල්මඩ 1 වන පටුමග අංක 12 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා නීතිය යටතේ සංස්ථාගත කර ඇති සමාගමක් වන බොබි ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවේට්) ලිමිටඩ් බන්ධනදයි වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2018ක් වූ ජූලි මස 21 වැනි දින ප. ව. 2.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2018.05.25 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, 2018.05.11 වැනි දින ලක්බිම අයිලන්ඩ් සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 750,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

*හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න.-* කළමණාකරු කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී එල් සී අංක 172, මඩවල පාර, කටුගස්තොට.

දුරකථන අංක : 081-2497910, 081- 2499336, 081- 2493341.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත, ලේවැල්ල පාර, මාවිල්මඩ, මහනුවර.
ෆැක්ස් : 081 - 2210595/071-8446374/071-496244
e.mail.wijeratnejayasuriya@gmail.com

06-1058

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - කටුගස්තොට ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ඉතා වටිනා පදිංචියට/ව්‍යාපාරයකට සුදුසු සියලු පහසුකම් සහිත දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය දඹුල්ල නගර සභා සීමාවන් තුළ දඹුල්ල නගරය E 465 ග්‍රාම නිලධාරී වසම පාදෙනිය ගමේ පිහිටි මහමූකලානයාය නොහොත් මූකලන් යායේ හේන නොහොත් ගල්වැටිය නොහොත් ගල්වැටියවත්ත නමැති ඉඩමෙන් බෙදවෙන් කළ ඉඩම් කොටසක් හා එහි පිහිටි ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ.

ඉඩමෙ ප්‍රමාණය : රූඩ් 01 පර්චස් 02.50

*දේපළට පිවිසීම* .- දඹුල්ල ඔරලෝසු කණුව හන්දියේ සිට කුරුණෑගල පාරේ මීටර් 400ක් පමණ දඹුල්ල මහ රෝහල පසුකර කෙටි දුරක් ගිය පසු පාරේ දකුණු පසින් දම්රෝ ප්‍රදර්ශනාගාරය ඉදිරි පසින් අදළ දේපළ පිහිටා ඇත.

මෙම දේපළ මහනුවර මාවිල්මඩ 1 වන පටුමග අංක 12 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වා ගෙන යනු ලබන ශ්‍රී ලංකා නීතිය යටතේ සංස්ථාගත කර ඇති සමාගමක් වන බොබි ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවේට්) ලිමිටඩ් බන්ධනදයි වශයෙන් හා ෆාතිමා ෂෆ්නා රසාක් උකස්කරු වශයෙන් ද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2018ක් වූ ජූලි මස 21 වැනි දින පෙ. ව. 10.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2018.05.25 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2018.05.11 වැනි දින ලක්බිම අයිලන්ඩ් සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය*. - මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,000,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

